## අන්තර්ජාලය

# මාධ්‍යමය පසුබෑම්




*මුල් අවධියේ ගැටුම්, මැසිවිලි, පසුබෑම්, කලකිරීම් කෙතෙක් තිබුණ ද අවසානයේ මාධ්‍ය ක්‍රියාකාරිකයන් විසින් තාක්ෂණය ජයගෙන, එමෙන්ම අනිසි තාක්ෂණික බලවේගද මර්ධනය කර තම ස්ථාවරයන් නිසි අයුරින් ශක්තිමත් කර ගැනීම සෑම අවස්ථාවකම අවසාන ප්‍රතිඵලය වී ඇත.*

**සිරිලාලන විජේසිංහ**

ආයතනික ක්‍රියාකාරකම්වල වපසරිය අතිශයින් විශාල එකක් වන බව ද, අපගේ අධ්‍යයන ක්ෂේත්‍රය, මාධ්‍ය කටයුතු අරබයා ලාංකීය ජාල ක්‍රියාකාරකම්වල වර්ධනය සම්බන්ධයෙන් කෙරෙන විමසුමකට සීමා කෙරෙන බවද අපි පසුගිය කලාපයේ පැවසුයෙමු.

එම කරුණු සම්පිණ්ඩනය කළ විට එය පහත දැක්වෙන ආකාරයේ සටහනකින් නිරූපණය කළ හැකි වෙයි.




අන්තර්ජාලය විද්‍යුත් සන්නිවේදන මාධ්‍යයක් වන අතර මෙහි තොරතුරු හුවමාරුව පූර්ණ වශයෙන් ම අති නවීන තාක්ෂණික ශිල්පෝපක්‍රම, ශිල්ප හරඹ මතින්ම සිදුකෙරෙනු ලබයි. එනම් ඉදිරිපත් කරන තොරතුරුවල මාධ්‍යමය වශයෙන් වටිනාකමක් තිබුණද නොතිබුණ ද එය ඉදිරිපත් කරන ස්වරූපය මතින් එයට යම් වටිනාකමක් ආරෝපණය කළ හැකි වෙයි.

ඉදිරිපත් කරන තොරතුරු අතිශයින් දුර්වල හෝ නොවටනා එකක් නම් එය කවර විශ්වකර්ම ස්වරූපයක් ඔස්සේ පාඨකයාට යොමු කළත්, එය පාඨකයාගෙන් ප්‍රතික්ෂේපවීම වැළැක්විය නොහැක්කේයි. (මෙහිදී පාඨකයා යන වචනය වෙනුවට වඩාත්ම අදාළ වචනය වන්නේ "පරීක්ෂකයා" යන්නයි. එහෙත් එය නවම භාවිතයේ නැති නිසා, විද්‍යුත් මාධ්‍ය සන්නිවේදනයේ දී භාවිතා කරන "ග්‍රාහකයා" යන්න සුදුසු යැයි හඟිමි. අන්තර්ජාලයට අදාළව පාඨකයා යන වචනයෙහි යම් මූලික නොගැලපීමක් ඇත. ජාලය ගැන අධ්‍යයනය කරන විට, වෙබ් අඩවිය Web site "සන්දේශ මූලය" හෙවත් තොරතුරු මූලාශ්‍රය Information source ලෙස අපට සැලකිය හැකිවන අතර "සන්දේශ පර්යන්තය" හෙවත් සන්දේශය ලබා ගන්නා අන්තය Destination වන්නේ පරිධියේ පරිගණකය භාවිතා කරන තැනැත්තායි. ඔහු තොරතුරු ග්‍රහණය කරන්නකු වන අතර, ඊටත් වඩා යම් අධිකාරී බලයක් සහිතව තොරතුරු පරීක්ෂා කරන්නකු වෙයි. එනිසා වඩාත්ම ගැළපෙන වචනය "පරීක්ෂක" යන්නයි. මේ ගැන ඉදිරි කලාපයකින් විස්තරාත්මකව කියවමු.)

යම් තොරතුරක කිසියම් වටිනාකමක් ඇත්තේ නම් එය අන් මාධ්‍ය ඔස්සේ ග්‍රාහකයා වෙතට ගමන් කරන ස්වරූපයට වඩා වෙනස්ව, ග්‍රාහකයාගේ ඇගේ හැප්පෙන ආකාරයට තොරතුර ඉදිරිපත් කිරීමට ජාල තාක්ෂණය සමත්කම් දක්වයි.

එනිසා අන්තර්ජාල සන්නිවේදනයේ දී මාධ්‍යමය වටිනාකම්වලට වඩා තාක්ෂණික වටිනාකම් කෙරෙහි යම් පමණකට අවධානය යොමු කරන්නට අපට සිදුවනු ඇත. ප්‍රතිශතාත්මක වශයෙන් සලකන කල්හි, මාධ්‍යමය ක්‍රියාකාරකම්වලට වඩා වැඩි බරක් තාක්ෂණික ක්‍රියාකාරකම්වලට අඩංගුවීම වැළැක්විය නොහැක්කේයි.

එය පරිගණක තාක්ෂණික වර්ධනයේ හා ඒවායේ වර්ධන කුසලතාවයන්හි ජයග්‍රහණයක් වන අතර, අන්තර්ජාලයේ උත්පත්ති ස්වරූපය හරහාම හිමිකරගත් ශක්තියක් ද වෙයි.

මේ හේතුව නිසාම, එනම් තාක්ෂණික ක්‍රියාකාරකම්වලට වැඩි අවධානයක් හා වැඩි බරක් යොමුවීම නිසාම යම් අවාසි සහගත තත්ත්වයක්, නැතහොත් මාධ්‍යමය ක්‍රියාකාරකම්වල වර්ධනයට අහිතකර බලපෑමක් ඇතිකරවන වෙනත් බලවේගයක් උත්පාද වී ඇති අතර අප වැනි නෙවන ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල එය දැඩි ප්‍රබලතාවයකින් ක්‍රියාත්මක වෙයි.

මෙම බලවේගය කවර ප්‍රබලතාවයකින් ක්‍රියාත්මක වන්නේද යත් එය මාධ්‍ය ලෝකය වසා පැතිරෙන තත්ත්වයෙන් නැතහොත් මාධ්‍ය ලෝකයේ ප්‍රබල ක්‍රියාකාරිකයන් අසරණ කරන තත්ත්වයෙන් කටයුතු සිදුවෙමින් පවතී.

එය අසාධාරණ වර්ධනයකි. සැබැවින්ම එය නො සිදුවිය යුත්තකි.

මෙම අසාධාරණ වර්ධන බලවේගය කුමක් ද? එය තාක්ෂණික අධිකාරීවාදයයි.

එම බලවේගයට එරෙහිව නැගී සිටීම එතරම් පහසු කාර්යයක් නොවේ. එමෙන්ම එයට එරෙහිව නැගී සිටීමට මාධ්‍ය ක්‍රියාකාරිකයන්ට හැකි නොවන ලෙසට කටයුතු කරන්නටද, මෙම බලවේගය හසුරුවන්නෝ සීරුවෙන් වගබලා ගනිති.

මෙය කිසිසේත්ම යහපත් තත්ත්වයක් නොවේ. නව තාක්ෂණය හා මාධ්‍ය කටයුතු එකට සංකලනය වූ සෑම අවස්ථාවකදීම පාහේ මේ තත්ත්වය අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක වූ බව මාධ්‍ය ඉතිහාසය ඔස්සේ පිය නගන්නෙකුට දැක ගත හැකි වෙයි. එහෙත් ඒ සෑම අවස්ථාවකදීම අවසාන ප්‍රතිඵලය වී ඇත්තේ කුමක් ද?

මුල් අවධියේ ගැටුම්, මැසිවිලි, පසුබෑම්, කලකිරීම් කෙතෙක් තිබුණ ද අවසානයේ මාධ්‍ය ක්‍රියාකාරිකයන් විසින් තාක්ෂණය ජයගෙන, එමෙන්ම අනිසි තාක්ෂණික බලවේගද මර්ධනය කර තම ස්ථාවරයන් නිසි අයුරින් ශක්තිමත් කර ගැනීම සෑම අවස්ථාවකම අවසාන ප්‍රතිඵලය වී ඇත.

ඒ තත්ත්වය මෙහිදී ද සැපිරෙනු ඇති වගට සාධනීය හැඟීමක් අපට ඇතිකර ගත හැකිය. එහි වැරැද්දක් නැත. එහෙත් ඉතිහාසයට වඩා අද තත්ත්වය බැරෑරුම් ය. අන්තර්ජාල තාක්ෂණයේ අති ධාවනකාරී වර්ධනය අපට ඒ පසුපස හඹා යා නොහැකි තරමට වේගවත් බව අපි මීට කලින් කියා ඇත්තෙමු.

එසේ නම් විමසිය යුත්තේ කුමක් ද? "අති මහත් වූ ජවයකින් තාක්ෂණය හඹා යමින් අවශ්‍ය ශක්තීන් උරා ගැනීමටත්, තාක්ෂණික අධිකාරීවාදයේ අසාධාරණ බලවේගය සමග හැප්පීමත් යන කරුණු දෙකම මාධ්‍ය ක්‍රියාකාරීනට අද දවසේ සාක්ෂාත් කර ගත හැකිවනු ඇත් ද?" යන්නයි.